# ආගමික නිදහස ආරක්ෂා කිරීමේ පනත

ඉදිරිපත් කිරිම - බුද්ධ ශාසන අමාත්‍යාංශය විසින්

දිනය – 2004.06 .01

මෙම පනත් කෙටුම් පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කිරිම - ගරු රත්නසිරි වික්‍රමනායක, බුද්ධ ශාසන අමාත්‍ය

ඉදිරිපත් කිරීමට නියමිත සංශෝධිත කෙටුම්පත

පූර්විකාව

ආගම් අතර අන්‍යොන්‍ය සමගිය ශක්තිමත් කිරීම සඳහා ද ජනතාව ඓතිහාසිකව භුක්ති විඳි ආගමික නිදහස ආරක්ෂා කිරීම සඳහා ද බලහත්කාරයෙන් හෝ බලය යෙදීමෙන් හෝ පෙළඹවීමෙන් හෝ වංචා සහගතව හෝ සදාචාර විරෝධී ලෙස හෝ වෙනත් ආකාරයකින් කරන වෙනත් ආගමකට හරවා ගැනීම තහනම් කිරීම සඳහා ද විධිවිධාන සැලසීම හා ඊට සම්බන්ධ කරුණු හා ඊට අනුෂාංගික කරුණු වෙනුවෙන් විධිවිධාන සැලසීම සඳහා වන පනතකි,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය

01 මෙම පනත 2004 අංක .............. දරණ " ආගමික නිදහස ආරක්ෂා කිරීමේ පනත " යනුවෙන් හැඳින්වේ,

වෙනත් ආගමකට හැරවීම නීතිවිරෝධී බව

02 කිසියම් පුද්ගලයෙකු විසින් වෙනත් කවර හෝ පුද්ගලයෙකු වෙනත් ආගමකට හැරවීමට හෝ හැරවීමට තැත් කිරීම නොකළ යුතු අතර යම්කිසි පුද්ගලයෙකු විසින් එසේ වෙනත් ආගමකට හැරවීම සම්බන්ධයෙන් ආධාර හෝ අනුබල දීම නොකළ යුතු යග

බලහත්කාරයෙන් අන්‍ය ආගමිකකරණය

03 සේවා යෝජකයෙකු හෝ කවර හෝ භාරකාර තත්ත්වයක සිටින හෝ විශ්වස්ත සම්බන්ධතාවයක් ඇති පුද්ගලයෙකු හෝ පූජකවරයෙකු හෝ හමුදාවන්හි හෝ පොලිස් නිලධාරියෙකු හෝ පාසැලක හෝ උසස් අධ්‍යාපන ආයතනයක හෝ ඉගැන්වීමේ හෝ පුහුණු කිරීමේ අන්කවර ස්ථානයක ගුරුවරයෙකු හෝ විදුහල්පතිවරයෙකු හෝ බන්ධනාගාරයක හෝ රැඳවුම් කඳවුරක හෝ නේවාසිකාගාරයක හෝ ආරෝග්‍ය ශාලාවක හෝ සාත්තු නිවාසයක හෝ සෞඛ්‍ය මධ්‍යස්ථානයක හෝ ළමා නිවාසයක හෝ වැඩිහිටි හෝ ආබාධිත හෝ රෝගීන් සඳහාවන නිවාසයක හෝ එවැනි වෙනත් කවර ස්ථානයක බලයලත් පුද්ගලයෙකු විසින් වෙනත් කවර හෝ පුද්ගලයෙකු ඔහු අයත් ආගමට අයත්

නොවන යාච්ඤා කිරීමකට හෝ ආගමික රැස්වීමකට සහභාගිවීම සඳහා පෙළඹවීම හෝ බලහත්කාරකමකට යටත් කිරීම හෝ එසේ කිරීමට තැත්කිරීම හෝ එවැනි යාච්ඤා කිරීමකට හෝ රැස්වීමකට සහභාගි නොවීමේ හේතුවෙන් එවැනි පුද්ගලයෙකු කවර හෝ දඬුවමකට හෝ අවාසි සහගත තත්ත්වයකට යටත් කිරීම හෝ එවැනි පුද්ගලයෙකුට එසේ නොවුයේ නම් භුක්ති විඳීමට හිමිකම් තිබු අයිතිවාසිකමක් හෝ වරප්‍රසාදයක් අහිමි කිරීම නොකළ යුතු ය,

04 ( i ) මෙම පනත යටතේ වරදක් ලෙස ප්‍රකාශයට පත් කෙරෙන කවර හෝ කටයුත්තක නියැලීමේ උපාය මාර්ග ඡවනුවෙන් කවර හෝ පුද්ගලයකු විසින් අරමුදල් හෝ සම්පත් ප්‍රේෂණය කිරීමල දැරීමල භාරව සිටීම, මාරු කිරීම හෝ පාවිච්චියට ගැනීම නොකළ යුතු ය,

වෙනත් ආගම්වලට හැරවීම සඳහා අරමුදල් භාවිතය

05 ( i ) අපරාධ නඩු විධාන සංග්‍රහයේ කවර හෝ විධිවිධානයක කුමක් සඳහන් වුව ද මෙම පනතේ 2, 3 හෝ 4 වැනි වගන්ති උල්ලංඝණය කරන කවර හෝ පුද්ගලයකු වරදකට වරදකරුවකු වන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ වැරදිකරුවෙකු වුවහොත් අවුරුදු පහ ( 5 ) කට නොවැඩි සිරදඬුවමකට හෝ රු. 100,000රු- කට නොවැඩි දඩයකට ද එම දඬුවම සහ දඩය යන දෙකටම යටත්වීමට සිදුවනු ඇත.

එතෙකුදු වුවත් වරද බාල වයස්කරුවකුට එරෙහිව කර ඇති විටක එවැනි යම් වරදක් කර වරදකරුවකු අපරාධ නඩු විධාන සංග්‍රහයේ ඊට පටහැනිව කුමක් සඳහන් වුව ද අවුරුදු හත ( 7 ) කට නොවැඩි සිරදඬුවමකට හෝ රු. 500,000/- කට නොවැඩි දඩයකට හෝ එම දඬුවම හෝ දඩය යන දෙකටම යටත්වීමට සිදුවනු ඇත.

( ii ) මෙම වරද කර ඇත්තේ 3 වැනි වගන්තියේ සඳහන් ස්ථානයක දී නම් දඬුවම් පැනවීමේ දී වඩාත් බරපතල කරුණක් ලෙස සැලකිල්ලට ගත යුතු ය.

( iii ) මෙම පනතේ 4 වන වගන්තිය උල්ලංඝණය කිරීම මත වරදකරුවන කවර හෝ පුද්ගලයකුට එවැනි පුද්ගලයකු භාරයේ පවතින 4 වන වගන්තියේ සඳහන් අරමුදල් හෝ සම්පත් සියල්ල හෝ අධිකරණ තීරණය කරනු ලබන ඉන් කවර වු කොටසක් රාජසන්තක කිරීමට යටත් වේ.

( iv ) 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ වගන්තිවලට පටහැනිව කුමක් සඳහන් වුවත් මෙම පනත යටතේවන සෑම වරදක් ම සංඥේය වරදක් ලෙස සැලකේ.

( ඩ ) පුද්ගල කණ්ඩායමක් විසින් මෙම පනත යටතේවන කවර හෝ වරදක් සිදුකර ඇති අවස්ථාවන්හි දී,

(අ) පුද්ගල කණ්ඩායම සංස්ථාපිත කණ්ඩායමක් වන අවස්ථාවන්හි දී සෑම අධ්‍යක්‍ෂවරයෙකු හෝ කොටස්කරුවෙකු හෝ නිලධරයෙකු

හෝ සාමාජිකයෙකු සේවකයකු එම වරදට වැරදිකරුවෙකු ලෙස සැලකේ.

(ආ) පුද්ගල කණ්ඩායම සංස්ථාපිත නොවූ කණ්ඩායමක් හෝ සමාගමක් වන අවස්ථාවන්හි දී එවැනි කණ්ඩායමක හෝ සමාගමකල සෑම හවුල්කරුවෙකුල සාමාජිකයෙකුල සේවකයෙකු හෝ නිලධරයෙකු එවැනි වරදකට වරදකරුවෙකු ලෙස සැලකේ.

( vii ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන තමා වෙත නිකුත් කර ඇති වීසා බලපත්‍රයක් මත ශ්‍රී ලංකාවට ප්‍රවේශ වී ඇති කවර හෝ පුද්ගලයකු මෙම පනත යටතේ කවර හෝ වරදකට වරදකරුවෙකු බවට ප්‍රකාශ කරනු ලැබූ විට ආගමන හා විගමන කටයුතු භාර අමාත්‍යවරයා විසින් ආගමන හා විගමන පනතේ 31 (1) උප වගන්තිය යටතේ එකී පනතේ වෙනත් කවර හෝ විධිවිධානයකට පටහැනිව කුමක් සඳහන් වුව ද රටින් නෙරපා හැරීමේ නියෝගයක් කළයුතු ය. එවැනි වරදකරුවෙකු බවට ප්‍රකාශයට පත්කරනු ලැබූවිට එවැනි පුද්ගලයකු එකී පනතේ 12 වගන්තිය යටතේ, " තහනම් සංචාරයකු " බවට ප්‍රකාශයට පත් කරමින් අදාළ අමාත්‍යවරයා විසින් තවදුරටත් නියෝගයක් කළ යුතු ය. මහේත්‍රාත්වරයා විසින් පනවනු ලබන දඬුවම නිම වීමෙන් පසුව එකී නියෝග බලාත්මක විය යුතු .

06 මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ නඩු පැවරීම පහත සඳහන් ආකාරයන් අනුව ආරම්භ කළ හැක.

( i ) වරදවල්වලින් පීඩාවට පත් පුද්ගලයකු විසින් හෝ උනන්දුවක් දක්වන වෙනත් කවර හෝ පුද්ගලයකු විසින් පොලීසියට හෝ වෙනත් බලයලත් නිලධාරියෙකුට කරන ලද පැමිණිල්ලක් අනුව පොලීසිය හෝ එවැනි යම් බලයලත් නිලධාරියෙකු හෝ

( ii ) වරදකින් පීඩාවකට පත් කවර හෝ පුද්ගලයකු විසින්

( iii ) මෙම පනතේ විධිවිධාන උල්ලංඝණය කර ඇති බැව් විශ්වාස කිරීමට හේතු ඇති මහජන යහපත පිණිස ක්‍රියා කරන කවර හෝ පුද්ගලයකු විසින්

එතෙකුදු වුවත් මෙම පනත ක්‍රියාත්මක කිරීමට පොලීසිය තම රාජකාරී කටයුතුවලින් නිදහස් නොවිය යුතු ය.

07 ( i ) මෙම පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අධිකරණ විෂය භාරව සිටින අමාත්‍යවරයා විසින් වරින්වර රෙගුලාසි සම්පාදනය කළහැකි අතර එම රෙගුලාසි ගැසට් පත්‍රයේ පල කළයුතු අතර පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළයුත්තේ ය.

08 වෙනත් ආකාරයක අර්ථ නිරූපනයක් අවශ්‍ය වන්නේ නම් හැර මෙම පනතේ ;

( අ ) " වෙනත් ආගමකට හරවා ගැනීම " යනුවෙන් අදහස් කෙරෙනුයේ කවර හෝ ආකාරයක පෙළෙඹවීමකින් හෝ පෙළඹවීමකට පොරොන්දුවීමකින් හෝ දීරි ගැන්වීමකින් හෝ දීරි ගැන්වීමට පොරොන්දුවීමකින් හෝ සහයෝගය දීමෙන් හෝ සහයෝගය දීමට පොරොන්දුවීමෙන් හෝ ලෙස හෝ වෙනත් ක්‍රියාමාර්ගවලින් හෝ පුද්ගලයෙකුගේ පළපුරුද්ද නැතිකම , විශ්වාස්තභාවය , අවශ්‍යතාවය , අඩු බුද්ධිමත්භාවය , බොළඳකම , දිළිඳුකම හෝ ආපදා තත්ත්වය උපයෝගි කර ගනිමින් :

( i ) කවර හේ ඍජු හෝ වක්‍ර ක්‍රියාවකින් හෝ හැසිරිමකින් පුද්ගලයකුට තම ආගම දෘෂ්ටිය , විශ්වාසය හෝ මතය අත්හැරීමට හෝ එම පුද්ගලයා අයත් නොවන වෙනත් ආගමක් හෝ ආගම් ඇදැහීමක්, ආගම් දෘෂ්ටියක් හෝ මතයක් වැළැඳගැනීමට ක්‍රියා කිරීමට යොමු කිරීමට හෝ බලපෑම් කිරීමට හෝ එසේ ක්‍රියා කිරීමට යොමු කිරීම් හෝ බලපෑම් කිරීමට හෝ එසේ ක්‍රියා කිරීමට යොමු කිරීම හෝ බලපෑම් කිරීමට තැත් කිරීම සඳහා හෝ ,

( ii ) යම් පුද්ගලයෙකුගේ ආගම, ආගම් ඇදැහීම හෝ ආගම් දෘෂ්ටිය, විශ්වාසය හෝ මතය කෙරෙහි හානි පැමිණවීමේ අරමුණින් ඔහුගේ ආගම, ආගම ඇදැහීම් හෝ ආගම් දෘස්ටිය හෝ මතය කෙරෙහි අනවශ්‍යය ලෙස බලහත්කාරයෙන් ප්‍රවේශවීම හෝ එසේ බල ප්‍රවේශ වීමට තැත් කිරීම.

(ආ) " පෙළඹවීම " යන්නට මුදලින් හෝ ද්‍රව්‍යමය කවර හෝ ප්‍රතිලාභයක් හෝ වරප්‍රසාදයක් වශයෙන් පිරිනැමෙන කවර ත්‍යාගයක් හෝ පරිතෝෂයක් ඇතුල්වන අතර මුල්‍යමය හෝ වෙනත් ආකාරයක කවර හෝ ප්‍රතිලාභයක් ප්‍රදානය කිරීම ද ඇතුලත් වේ.

(ඇ) "බලහත්කාරයෙන්" යන්නට බලය යෙදීම, බලකිරීම, හෝ අනිසි බලපෑම් ඇතුලත් වේ.

(ඈ) “බලය යෙදීමෙන්" යන්නට කවර ආකාරයක හෝ තර්ජන හෝ හිංසා හෝ පීඩා හෝ දේවශාපය පිළිබඳ තර්ජන හෝ කවර හෝ ආගමක් හෝ ආගම් විශ්වාසයක් පරිභවයට ලක්කිරීම හෝ සමාජයෙන් නෙරපා හැරීම ඇතුලුව බලය පෙන්වීම ඇතුලත් වේ.

(ඉ) "වංචා සහගත" යන්නට සාවද්‍ය කරුණු ඉදිරිපත් කිරීම ඇතුතලුව කවර ආකාරයක හෝ වංචා සහගත උපක්‍රම ඇතුලත් වේ.

(ඊ) "සදාචාර විරෝදී" යන්නට ආගමක් ප්‍රචලිත කිරීමේ ආචාර සම්පන්න නොවන කවර හෝ ක්‍රියාවලියක් ඇතුලත් වේ.

(උ) "පුදගලයා" යන්නට යම් පුද්ගලයෙකු හෝ සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ ආයතනයක් ඇතුළත් වේ. තවද පනතකින් සංස්ථාගත හෝ සමාගම්

රෙජිස්ටාර් හෝ අයෝජන ප්‍රවර්ධන මණ්ඩලය යටතේ අනුමත ව්‍යාපෘති ද ඇතුළත් වේ. එමෙන් ම භාරකාර ආඥා පනත යටතේ ලියා පදිංචි භාර ද ඇතුළත් වේ.

(ඌ) "පූජක" යන්නට යම් ආගමකට අයත් පූජ්‍ය , පූජක පක්ෂයේ සාමාජිකයෙක් ඇතුළත් වේ.

(එ) "පුද්ගලයෙකු" යන්නෙන් බැංකුවක්, මූල්‍ය සමාගමක් , ණය දෙන ආයතනයක් මහා භාරකරු හෝ වෙනත් කවර හෝ භාරකරුවෙකු ද ඊට ඇතුළත් විය හැක.